*පසු ගිය කලාපයෙන්*

මාලිංගගේ කථා බහත්, මිත්‍රශීලීභාවයත් කුමාගේ සිත්ගත් බව පෙනී-ගිය අතර කුමා ද මාලිංගගේ හිතට අල්ලා ගිය බව මට වැටහිණ. ගෙතුළට ගොස් 'ග්‍රැන්මා' පත්තරය ගෙන ආ මාලිංග ගැන එල්සැල්වදෝරයේ උද්ගතව තිබූ තත්ත්වය ගැන මා සමඟ කථා කළේ ග්‍රැන්මාහි වූ ඇතැම් පෘවෘත්ති හා ඡායාරූප පෙන්වමිනි. එල්සැල්වදෝරය මධ්‍යම ඇමරිකාවේ වූ පැසිෆික් සාගරයට මායිම්ව තිබූ රටකි. ගෝතමාලා, හොන්දුරාස්, නිකර්ගුවා, කොස්ටාරිකා, මනගුවා එහි අසල්වාසී රටක් විය. 1980 වර්ෂය වෙද්දී එල්සැල්වදෝරයේ සිටි යැංකි රූකඩයක් වූ ඒකාධිපති පාලකයාට එරෙහිව පැන නැගි ජනතා අරගල සිවිල් යුද්ධ තත්ත්වයක් බවට පෙරළී විමුක්ති සටනක ජයග්‍රහණයකින් අවසන් වන ලකුණු පහළ කරමින් තිබුණේ ය. නිකරගුවාවේ සැන්ඩිනිස්ටා ව්‍යාපාරයෙන්ද, කියුබාවෙන්ද එල්සැල්වදෝර අරගලයට ආධාර ලැබිණි.

මාලිංගත් මමත් කථාකළ මෙම තොරතුරු කුමා අසාගෙන උන්නේ කටද ඇරගෙන ය. එම මොහොතේ සිටම නගරයට යන අතරතුරේදීත් කුමාගේ උනන්දුව වූයේ එල්සැල්වදෝරය ගැනය.

ඉන් දෙදිනකට පසු කලබලයෙන් මෙන් මා සොයාගෙන ආ කුමා බයිසිකලයෙන් බැස හති දමන්නට විය.

"සහෝදරයා, මම මේ වැඩ කරන ගමන් අනුන්ගේ බයිසිකල් කට්ටකුත් ඉල්ලගෙන දුවල ආවේ. කොහොමද එල්සැල්වදෝරේ අපි දිනලද ?

"අපොයි තවම නෑ. ඒක එහෙම ලේසියෙන් දිනන්න පුළුවන් එකක් නෙවේ. අරගලේ දිගටම යනවා."

"මම නම් හිතන්නේ අපි දිනයි. යමුද මාලිංග සහෝදරයාගෙන් වත් මුකුත් දැනගන්න."

"මාලිංග අද උදේ කොළඹ ගියානේ."

"සහෝදරයා ඉංග්‍රීසි පත්තරේ බලලා මුකුත් තිබුණොත් මටත් කියන්න."

මගෙන් ඉල්ලීමක් කළ කුමා තරමක් අපහසුවෙන් බයිසිකලයට ගොඩ වී එය පැදගෙන ගියේ ය.

එදිනෙන් පසු මාලිංග ගම පැමිණ ඇති බව මගෙන් දැනගත් විට කුමා ඔහු හමුවීමට ගියේ ය. කුමා තමා හමුවීමට පැමිණීම ගැන මාලිංග




# හද රිදවන මතක සුවඳ

රෝහිත මුණසිංහ

*ප්‍රංශයේ සිට*

සතුටු විය.

"කුමානායක සහෝදරයා මම දැක්ක ගමන් අහන පළවෙනි ප්‍රශ්න තමයි, කොහොමද එල්සැල්වදෝරේ කියන එක. සැල්වදෝර අරගලය මර්දනය උනාට ඒ අහිංසකයගෙ හිත රිද්දන්නෙ කොහොම කියලා මට ඒක කියන්න හිතුනෙ නෑ." පසු කලෙක මාලිංග මට පැවසී ය.

> එල්සැල්වදෝරය පිහිටා තිබෙන්නේ කොහෙද කියාවත් කුමා නොදන සිටි බව මට විශ්වාසයි. ඒත් ලෝකයේ කොහේ හෝ රටක සමාජවාදය බිහිවනු දකීමට, විපල්වාදීන් ජයග්‍රහණය කරනු දකීමට උගතුන් හෝ බුද්ධිමතුන් නොවූ මේ අහිංසක මිනිසුන් කොතෙක් නම් ආශා කළෝ ද? ජාත්‍යන්තරවාදයෙහි සැබෑ අරුත දන හෝ නොදන සිටියා වුවද කුමා වැනි සහෝදරයන් සැබෑම ජාත්‍යන්තරවාදීන් නොවේ ද?

එල්සැල්වදෝරය පිහිටා තිබෙන්නේ කොහෙද කියාවත් කුමා නොදැන සිටි බව මට විශ්වාසයි. ඒත් ලෝකයේ කොහේ හෝ රටක සමාජවාදය බිහිවනු දැකීමට, විපල්වාදීන් ජයග්‍රහණය කරනු දැකීමට උගතුන් හෝ බුද්ධිමතුන් නොවූ මේ අහිංසක මිනිසුන් කොතෙක් නම් ආශා කළෝ ද? ජාත්‍යන්තරවාදයෙහි සැබෑ අරුත දැන හෝ නොදැන සිටියා වුවද කුමා වැනි සහෝදරයන් සැබෑම ජාත්‍යන්තරවාදීන් නොවේ ද?

පක්ෂය තහනම් වූ පසුව මට කුමා හමු වූයේ නැත. පසුව මට ආරංචි වූයේ ඔහු දෙනියාය පැත්තේ රෝහලකට මාරු වී ගිය බව ය.

භීෂණ සමයේදී මේ සොයුරාට යම්කිසි අනතුරක් සිදුවීද ? නැතහොත් ඔහුට කුමක් සිදුවෙන්නට ඇතිද ?

ගම - රට සිහිවන හැමදාකම පවුලේ ඇත්තන්සේම මට මගේ අතීත මිතුරන්ද, දේශපාලන ජීවිතයේ හමු වූ සොයුරන්ද සිහිපත් වෙයි. කුමානායක ඉන් එක් අයෙකි. විස්තර කළ නොහැකි හේතුවක් නිසා කුමා සිහිවන විටදී 'සැමී' හා 'ඩැනී' යන සොයුරන්ද මගේ මතකයට නැගෙයි. ඔවුන් දෙදෙනා ගැන පමණක් නොව මැනේජර් සහෝදරයා, එවරෙඩි පූසා සහෝදරයා, තාත්තා හා අම්මා ගැනද ලිවිය යුතුය.

මාතර දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාස හෙවත් මන්ත්‍රී ආසන හතරක් තිබිණ. ඒවා නම් මාතර, දෙවිනුවර, හක්මන, කඹුරුපිටිය, දෙනියාය, අකුරැස්ස හා වැලිගම යි. මෙම ආසන හතෙන් ජනතා විමුක්ති පෙරමුණේ පූර්ණ කාලීනව හා අර්ධ කාලීනව වැඩ කිරීමට වැඩිම සහෝදර සහෝදරියන් පිරිසක් ඉදිරිපත්ව තිබුණේ අකුරැස්සෙනි.

ජ.වි.පෙ. අකුරැස්ස කාර්යාලය පිහිටුවා තිබුණේ බස් නැවතුම් පොළට ආසන්නව නගරය මධ්‍යයේම ය. නගර මධ්‍යයේ ඇති ගොඩනැ-ගිලි දෙකක් අතර අඩි පහළොවක පමණ වූ පරතරයක් පැවතියේ එම පටුබිම් කඩ මැදින් පල්වතුර කාණුවක් ගලා ගිය බැවිනි. කුණුවතුර කාණුවට යටින් ගලා යාමට ඉඩ දී පක්ෂ කාර්යාලය ගොඩනගන ලද්දේ අඩි හතක් පමණ උසට පොල්කොට සිටුවා එම පොල් කොට වේදිකාව මත කාමරයක් ඉදිකිරීමෙනි. කාර්යාල කාමරයේ බිත්ති පිටලෑලි ගසා ශක්තිමත්ව තනා තිබූ අතර වහල හෙවිල්ලා තිබුණේ පොල් අතුවලිනි.

දේශපාලන වැඩ කටයුතුවලට අමතර මට සතියකට වරක් අකුරැස්සේ කාර්යාලයට යාමට සිදුවූයේ වැලිගම, අකුරැස්ස හා දෙනියාය යන ආසන තුනට 'නියමුවා' පුවත්පත බෙදා හැරීම භාරව තිබුණේ මට නිසා ය. අකුරැස්සට පත්තර මිටිය භාරදී දෙනියායට පත්තර දීමට ගියත් මා ගියේ මොරවක දක්වා පමණි. මොරවකට පැමිණෙන දෙනියායේ සහෝදරයෙකු පත්තර භාර ගත්තේය. මේ ගමන මා ඉතා කැමැත්තෙන් ගියේ ගංගා, ඇළ, දොළ, තේ වතු රබර් වතු, වට වංගු හා කඳු ප්‍රපාත අතරින් බස් රථය ඇදී ගිය නිසා ය. ජනතාවගේ ප්‍රවාහන සේවය වූ ලං.ග.ම. නිරුපද්‍රිතව තිබූ එකල ගමනාගමනය දස වධයක් වූයේ නැත.

පොළවෙන් අඩි 7ක් පමණ ඉහළින් වූ අකුරැස්ස ජ.වි.පෙ. කාර්යාලය භාරව සිටියේ 'සැමී' සහෝදරයා ය. සැමී සහෝදරයා සිරුරෙන් කුඩා ය. බාල කල වැලඳි යම් රෝගයක් නිසදෝ අත පයේ වූයේ ඇඹරී ගිය ස්වරූපයකි. ඇස් පෙනීම දුර්වලව තිබූ අතර එක් ඇසක් නොපෙනී යමින් තිබුණි. පත්තර මිටිය ද කර ගසාගෙන කාර්යාලයට ගොඩ වෙන මා මඳ වේලාවක් එහි රැඳී සිට, "සැමී සහෝදරයා, බොමුද කහට එකක් ?" යයි විමසමි. "ඔහේ නෑ සීනි තේ කොළ මොකවත්." කියා අහක බලාගෙන හිනාවෙන සැමී මට තේ කෝප්පයක් සාදා දෙයි.

එළියකන්ද වධ කඳවුරේදී ගතවී ගිය එක්තරා රැයක අපහට රාත්‍රී කෑම දී අවසන් වූ විගසම වාගේ 'සැමී මෙහෙ වරෙන් යකෝ' යයි වධක සෙබළෙක් මුර ගෑවේ ය. රාත්‍රී කෑම දෙනවිට ලිහා දමන ලද දෙනෙත වසා බඳින ලද රෙදිකඩ එම මොහොතේදි බැඳ නොතිබුණි. එම මුරගෑමට අනුව අප රඳවා සිටි කාමරයට යාබද කාමරයේ සිටි කෙනෙකු බිම වාඩි වී සිටි උන් අයගේ කකුල් පාගමින්, ඔවුන්ගේ ඇඟේ හැපී වැටෙන්නට යමින් අප උන් තැනට ආවේ ය. දෙයියනේ ! සැමී සහෝදරයා ?

"ඉඳා, දෑත බදලා කෙළලා දාපිය මුන්ගෙ ඔළු කටු කුඩු වෙන්න."

වධකයෙකු සැමී ඇතට දුන්නේ ඔවුන් සිරකරුවන්ට තඩිබාන මහ මුගුරකි.

මුගුර දෑතින් තවර ගත් සැමී එය දෙපසට වනමින් පහර එල්ල කරන්නට විය. අප බිම ඇන බාගෙන සිටින්ම කාමරයේ ඒ මුල්ලටත් මේ මුල්ලටත් ගුළි වූයේ දෑතින්ම හිස් ද බදලාගෙනය. එහෙත් සැමී එල්ල කරන පොලු පහරවල් කිසිවකුටත් නොවැදුනේ ඔහු අප සිටින ඉසව්ව ශබ්දයෙන් දැනගෙන ඒ දෙසට ළං වන විය කාමරයේ අනෙක් මුල්ලට ගාල් වූ බැවිනි. එවිට සැමී එල්ල කරන පොලු පහරවල් වැදුනේ බිත්තියට ය. එම මොහොතේ මට හැඟී ගියේ සැමී සම්පූර්ණයෙන්ම අන්ධභාවයට පත්ව ඇති බව ය.

"හා - හා - නවත්තපිය. තෝයි - මායි දන්න ගැහිල්ල"

මෙවැනි අමානුෂික ක්‍රීඩාවලට මහත් කැමැත්තක් දක්වන වධක සෙබල සැමී අතින් මුගුර ගෙන අප සැමට පහර දීගෙන දීගෙන ගියේ ය. එවැනි අවස්ථාවක් කළයුතු හොඳම දෙය අප දැන සිටියෙමු. එනම් හිස බිමට පහත්කර, හිස පිටුපස දෙඅතින් ආවරණය කරගෙන කොන්ද නවා පොලු පහර පිට මැදට ලබා ගැනීමය. දෑත පා, බිඳගෙන ඔළුව පළා ගැනීමට වඩා එම ක්‍රමය ආරක්ෂාකාරී පියවරක් විය.

මේ අවස්ථාවේ සැමීගේ එක් ඇසක් මගේ දෙනෙත හා ගැටිණ. ඒය පුදුමයෙන් මෙන් විශාලව තත්පර තිහක් පමණ මගේ දෑස මත රැඳී තිබුණේ ය. සැමී මා හඳුනා ගත්තා නොවේ ද? එසේ නම් ඔහු සම්පූර්ණයෙන් අන්ධභායවයට පත්ව නැත. ඔහුගේ එක් ඇසක් තරමක් දුරට හෝ පෙනෙයි. කිසිවක්ම නොපෙනෙන අන්ධයෙකුසේ ඔහු බිත්තියට ගැසුවේ ඇයිදැයි සිතාගැනීම මට අපහසු කාරණයක් නොවීය.

එළියකන්ද වධ කඳවුරේදී මා සැමී දුටු පළමු වතාවත්, අවසන් වතාවත් එයම විය. මා ඉමහත් පුදුමයට පත්වූයේ සැමී සහෝදරයාගේ කෙසඟ දුර්වල ශරීරය මෙතරම් දරුණු පොලු පහරවල් හා වධ වේදනාවෙන් උසුලාගෙන සිටියේ කෙසේද යන්න ගැන ය.

ඉන් මාස දෙකකට පමණ පසු මාද ඇතුළු 40 දෙනෙකු පමණ බූස්ස රැඳවුම් කඳවුර වෙත රැගෙන ගියද සැමී ඒ පිරිස අතර නොසිටියේය. දරුණු පොලු පහරවලට ලක්වීමෙන්, පිටපුරා ඇති තුවාල කුණුවීමෙන් හා පණුවන් ගැසීමෙන්, පාචනය වැලඳීමෙන් ඉතා සුළු අතපසුවීමකට බිහිසුණු ලෙස පහර දීමෙන් යන ඕනෑම කරුණකින් මරණය ළංවිය හැකි එළිකන්ද වද කඳවුරේ සිරකරුවන්ගේ ජීවිත රැඳි තිබුණේ තණපත් අග රැඳී ඇති පිනිබිඳු විලසිනි. එම අති බිහිසුණු වධකාගාරයෙන් සැමී සහෝදරයා ජීවිතය රැක ගත්තේ නම් එය ආශ්චර්යයකි.

'සැමී' සහෝදරයා අකුරැස්සේ පක්ෂ කාර්යාලය භාරව සිටියාක් මෙන් මාතර පක්ෂ කාර්යාලය භාරව උන්නේ 'ඩැනී' සහෝදරයා ය. ඩැනී සහෝදරයා මිටි ය. තරබාරු ය. විශාල උදරය නිසා, තරබාරුව වඩාත් කැපී පෙනේ. බුරියෙන් පහලට සරම ඇඳ කමිසයක් නොඇඳ ඉන්නා ඔහුගේ පපුව මවිල්වලින් ගහනව ඇති බැවින් තරමක නගරංකාර පෙනුමක්ද පළවෙයි. එහෙත් විහිළුවට තහළුවට කැමති, කෝප නොගන්නා ඔහු පක්ෂ කාර්යාලයට එන සැම සහෝදර සහෝදරියකගේම සිත් දිනාගෙන උන්නේ ය.

තදින්ම මත්පැන් පානයට හා දුම්පානයට ඇබ්බැහි වී සිටි අයවලුන් පවා ජ.වි.පෙ. ට සම්බන්ධ වීමෙන් පසු එම පුරුදුවලින් අත් මිදුනේ පුදුමාකාර අන්දමිනි.

"අනේ පුතේ, මේ අපේ එකාවත් ඔහෙලයි පක්ෂයට අරගෙන හදලා දෙන්න. මූ අතන මෙතන කසිප්පු ගුබ්බෑයම්වල, රා පොළවල් වල ලැග ලැග, ගංජා බිබී නිකම්ම විනාශ වෙලා යනවා.

ඇතැම් මව්වරුන් පක්ෂයේ සහෝදර වරුන්ගෙන් එසේ ඉල්ලා ඇති අවස්ථාවන් තිබිණ.

මැතිවරණ ක්‍රියාදාමයට අනුගතව ප්‍රසිද්ධ දේශපාලනයට එළඹි කල සමාජයේ සෑම මට්ටමකම, සෑම තරාතිරමකම මිනිසුන් ඇසුරු කිරීමේ හා එසේ ඇසුරු කළයුතු ප්‍රස්ථාව පක්ෂයේ සොයුරන්ට ලැබිණ. සිගරට් සුරුට්ටු බොන පක්ෂයේ සාමාන්‍ය හිතවතුන් පවා පක්ෂයේ සොයුරකු ඉදිරියේ එසේ නොකළේ විනයෙන් යුතු පුද්ගලයෙකු ඉදිරියේ එසේ කිරීම නොමනා යයි සිතූ හෙයිනි. නැතහොත් එසේ කරන්නට ලැජ්ජා වූ බැවිනි.

පක්ෂයට සම්බන්ධ වීමට පෙර ඩැනී සහෝදරයා හොඳ බේබද්දෙකුව සිටියාය යන්න පමණක් නොව නීති විරෝධී හොරසුරා අලෙවි කරන්නෙකුවද සිටි බව පක්ෂයේ සොයුරන් කථා බහ කළ දෙයකි. අයථා අන්දමින් එසේ උපයාගත් මුදල් අතේ මිටේ ගැවසුනෙන් එකළ ඔහු වටා බොහෝ මිතුරන්ද සිට ඇත. එම නිසා ඔහු යම් වැරදි ක්‍රියාවලට ද පැටලී තිබේ. එහෙත් පක්ෂයේ සිටි ඩැනී සහෝදරයා ඒ සියල්ලන්ගෙන්ම මිදුණු යහපත් පුද්ගලයෙකුව සිටියේ ය.

මාතර පක්ෂ කාර්යාලය පිහිටුවා තිබුණේ උයන්වත්ත ක්‍රීඩාංගණයට නුදුරුව අකුරැස්ස - මාතර මාර්ගයට මායිම්ව ය. උයන්වත්ත ක්‍රීඩාංගණයේ පුරා සතියක් පැවැත්වූ 'අප්‍රේල් විරු සමරුව' නිසා පක්ෂ කාර්යාලය මොහොතක ඉස්පාසුවක් නොලබන තැනක් බවට පත්ව තිබුණේ ය. මහ කල්දේරමකට බත් තම්බ තම්බා කරවල හොද්දක් සමඟ පිඟන්වලට බෙදාදෙන තෙක් අප ඩැනී සහෝදරයා ළඟ පෝලිම් ගැසී බලා සිටියේ මාතර බන්ධනාගරයේ මුළුතැන්ගේ බත් බක්කිය ඉදිරිපිට ඇලුමිනියම් තැටිය ගෙන පෝලිම් ගැසී හිටි හැටි මගේ සිහියට නංවමින් ය.

'ඩැනී සහෝදරයා මරා දාලා' යන ආරංචිය මවෙත ගෙන ආවේ තල්පාවිල නිමල් සහෝදරයා බව මට හොඳට මතක ය.

(ලබන කලාපයට)